GALLE
HERITAGE
FOUNDATION

# ගාලු උරුමය

III කලාපය | ජූලි -සැප්තැම්බර්

## GALLE HERITAGE

### ලෝක උරුමයක අභිමානය සුරකින නිල පුවත් සංග්‍රහය



ලිපිනය: නො. 12, රැම්පාට් වීදිය, කොටුව, ගාල්ල.
දුරකතනය: 091 224 6784
Email: herifo@sltnet.lk
Website: www. galleheritage.gov.lk

# <u>කර්තෘ මණ්ඩලය</u>

## උපදේශකත්වය

- මහාචාර්ය දේව මයිකල් ද සිල්වා මයා
- ඩබ්.ඒ. මධුෂ්ක රංගන මයා

## ප්‍රධාන සංස්කාරක

- ඩබ්. ඒ. අයේෂා මිය

## සංස්කාරක මණ්ඩලය

- පී.ජී.එන්. චන්දිමාලි මිය
- බී.එස්. ඉලේපෙරුම මිය

## ඡායාරූපකරණය, වෙබ් සහ සමාජ

- ඉෂානි ප්‍රියදර්ශනී මිය

## විශේෂාංග

- රිද්මි නානායක්කාර මිය
- රොෂාන් එන්. රණසිංහ මයා
- අනුෂි චාන්දිමා මෙනවිය
- චම්පා කුමුදුනී මෙනවිය
- ඩිලානි හර්ෂිකා මෙනවිය
- ශිරංග ජයසේකර මයා
- ප්‍රමුදි රාජරත්න මෙනවිය
- ටී.එච්. තිසරි භාග්‍යා මෙනවිය

# ඇතුල් පිටු අතර.........


| | | |
|---|---|---|
| 1. | උරුමයක අන්දරය | 1-3 |
| 2. | ඉතිහාසයේ පියසටහන් | 4 |
| 3. | “පිංතාලිය” ජල ව්‍යාපෘතිය | 5 |
| 4. | දැන ඉගෙන සංචාරය කරමු | 6 |
| 5. | **Digitalize** වන ශාක නාමකරණය | 7 |
| 6. | උරුම සායනය **\| Heritage Clinic** | 8-9 |
| 7. | **HERITAGE WITH FUTURE** – 2026 | 10 |
| 8. | ගාලු කොටුවට හුස්ම පිඹින “කළු කොටුව” | 11-12 |
| 9. | උරුම ආරක්ෂණයේ හෙට දවස | 13 |

# උරුමයක අන්දරය

ඓතිහාසික ලෝක උරුමයක් වන ගාලු කොටුව ආසන්න වශයෙන් අක්කර 85 ක භූමි ප්‍රමාණයක විහිදී පවත්නා අතීත යුගයන් ත්‍රිත්වයක මතකයන් දරා සිටින ලාංකේය උරුම සලකුණකි.

මෙහි ගොඩනැගිලි අතරින් බහුතරය යටත් විජිත සමයේ දී පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි ජාතිකයන් විවිධ අවශ්‍යතා මත ඉදිකරන ලද ඒවාය. විශේෂයෙන්ම යුධ බලකොටුවක පැවැත්ම උදෙසා බිහි වූ යුධ කාමර, යුධ නේවාසිකාගාර, ආරක්ෂිත බැමි, සිර මැදිරි, වෙඩි බෙහෙත් ගබඩා ආදියෙහි නටඹුන් අද ද මෙහි දැකිය හැකිය.

මෙහි පවත්නා ඓතිහාසික වූ පුරාවිද්‍යාත්මක අගයත්, වාස්තු විද්‍යාත්මක සහ සෞන්දර්යාත්මක වටිනාකමත් විඳීමට විශේෂයෙන්ම විදේශීය සංචාරකයින් වැඩි කැමැත්තක් දක්වන බව දැකිය හැක. ඉංග්‍රීසින් විසින් ගාලු කොටුව පරිපාලන කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමත් සමග මෙහි ගොඩනැගිලි ව්‍යුහයන් එම අවශ්‍යතා වෙනුවෙන් පරිවර්ථනයන් වී ඇති අතර එම ජාතීන්ගේ ඉහල ස්ථරවල නිලධරයන් වෙනුවෙන් වෙන් කරන ලද නිල නිවාස බොහොමයක් ද මෙහි පිහිටා ඇත. ප්‍රමුඛ පෙලේ වෙළඳ නගරයක් වූ මෙහි වෙළඳ කාර්යාල සහ ආගන්තුක සත්කාර ලබාදීම සඳහා වූ භෝජනශාලා සහ හෝටල් පරිශ්‍ර අද දක්වාම සක්‍රියව පවතින බවට සංචාරක ඔබට දැකගත හැකිවනු ඇත.

**ඉතිහාසය නැවත නැවත අලුත් වේ. එබැවින් යටත් විජිත සමයේ ඉදිකිරීම් වාස්තු විද්‍යාත්මක සංකල්ප හඹායන්නෙකුට ලොව සතරදිග ඇවිද යමින් රැස්කිරීමට වෙහෙසවන තොරතුරු එක් ස්ථානකින් දැකබලා හදෑරීමට නම් ගාලු කොටුව කදිම නිදර්ශක භූමියකි.**

❖ **පැරණි ඕලන්ද ගබඩා ගොඩනැගිල්ල**

එවකට දකුණු ආසියාවේ දිගම ගබඩා ගොඩනැගිල්ල ලෙසින් පෘතුගීසීන් පලවා හැරීමෙන් පසු 17 වන සියවස අවසානයේ දී ඕලන්ද ජාතකයින් විසින් මෙය නිර්මාණය කර ඇත. මහල් දෙකකින් යුතු මෙම ඉදිකිරීම ඓතිහාසික කලු කොටුවේ සිට කොමාන්ඩමන්ට් මුර අට්ටාලය දක්වා විහිදී ඇත. එම යුගයේ දී ගාලු කොටුවට පිවිසීමට පැවති එකම දොරටුව ද මෙම ගොඩනැගිල්ල හරහා ඉදි කිරීම මගින් ගබඩා මෙහෙයුම් කටයුතු පහසු කිරීමත් පිවිසුම් දොරටුව පාලනයත් එකවර සිදුකර ඇත. මෙහි ඉහළ මහලේ දැවමය සොල්දරයන් සහිත කොන්ක්‍රීට් යොදන ලද පොළවක් දක්නට හැකිය. බිත්ති බැඳීම සඳහා කොරල් මෙන්ම ගඩොල් ද භාවිත කර ඇත. ඉහළ මහල වැඩි වටිනාකමින් යුත් කුරුඳු වැනි ද්‍රව්‍ය තැන්පත් කිරීමට ද දකුණු පස එක් කොටසක පල්ලියක් පවත්වාගෙන යාම සඳහා ද භාවිත වූ බව දෙණියාය මූලාශ්‍රවල සඳහන්ය. වර්තමානයේ දී ඉහළ මහලේ මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයක් සහ පහළ මහලේ දකුණු කොටස තුළ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් සමුද්‍ර කෞතුකාගාරයක් ද පවත්වාගෙන යනු ලැබේ.





## පැරණි ඕලන්ද රෝහල

ආක(ර්)ස්ලූට් මුර අට්ටාලයට යාබදව පිහිටි මෙම ඓතිහාසික ගොඩනැගිල්ල බ්‍රිතාන්‍යයන් විසින් සංස්කරණය කරන ලද රෝහල් පරිශ්‍රයයි. ඕලන්ද පාලන සමයේ ද ස්වකීය රෝහල පිහිටා තිබූබව පැරණි ඕලන්ද සිතියම් නිරීක්ෂණයේ දී දැකගත හැකිය. තනි මහලක් සහිත මෙම රෝහල් ගොඩනැගිල්ල මහල් දෙකක් බවට පත්කරන ලද්දේ බ්‍රිතාන්‍යයන් විසින්ය.මෙහි බිත්ති වල යම් යම් ස්ථාන මත කොරල් බිත්ති දක්නට ලැබෙන අතර ටෙරකොටා ගඩොල් සහ කොන්ක්‍රීට් යොදා ඉදිකරන ලද පොළවක් මෙහි දක්නට හැකිය. 19 වන ශත වර්ෂයේ අවසාන භාගය දක්වා මෙම ගොඩනැගිල්ල බ්‍රිතාන්‍ය හමුදා රෝහල ලෙස භාවිත වූ අතර පසුව 20 වන ශත වර්ෂයේ සිට වර්ෂ 2004 දක්වා කච්චේරිය ලෙස භාවිත කරන ලදී. පසුව ගාලු උරුමය පදනම කාර්යාලය මෙහි පැවැති අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් පසු කාලීනව මෙම ගොඩනැගිල්ල සංරක්ෂණය කොට කොටස් බෙදා වෙන්කර ව්‍යාපාරික ප්‍රජාව සඳහා බදුපදනමින් ලබා දී ඇත.









## ඕලන්ද රෙපරමාදු දේවස්ථානය/ ප්‍රොතෙස්තන්ත දේවස්ථානය

බැරොක් සම්ප්‍රදායට අනුව කෘසි ෆෝම් හැඩයෙන් නිර්මාණය කරන ලද මෙම අලංකාර දේවස්ථානය මැද වීදිය සහ පල්ලිය වීදිය හමුවන මංසන්දියට ආසන්නව දකුණු පසින් පල්ලිය වීදියට මුහුණ ලා ඉදි වූ මෙය වර්ෂ 1755 දී ආගමික සේවා කටයුතු වෙනුවෙන් විවෘත වී ඇත. කොරල්, ටෙරාකොටා ගඩොල්, කළු ගල් සහ හුණු මිශ්‍ර වැලි යොදා ගනිමින් මෙම මනස්කාන්ත ගොඩනැගිල්ල ලන්දේසීන් විසින් ඉදිකර ඇත. පෘතුගීසි පාලන සමයේ දී ෆ්‍රැන්සිකන් කැපියුඩින් කන්‍යාරාමයක් මෙහි පැවති බව ඓතිහාසික මූලාශ්‍රවල සඳහන්වන අතර එවකට ගාල්ලේ කමාන්ඩර්වරයා වූ කැස්පාරිස් ඩි යොංග් විසින් විශාල වියදමක් දරා ඇත. දිගු කාලයක් දරුවන් නොමැති සොවින් සිටි ඔහුගේ භාර්යාවට දරුවෙකු ලබාදීම වෙනුවෙන් දෙවියන් වහන්සේට ස්තූති කිරීම උදෙසා ඔහු විසින් මෙහි දේවස්ථානය ස්ථාපිත කර ඇති අතර අද දවසේ ද මෙහි දේව මෙහෙයන් සිදුකෙරේ.

## කෞතුකාගාර ගොඩනැගිල්ල

ගාලු කොටුවේ භූ විශමතාවය අනුව උස් බිමක ඉදිකරන ලද මෙය පල්ලිය වීදිය ආරම්භයේ දකුණු පසින් දැකගත හැකිය. කොටු බැම්මට ආසන්නව ෆිෂ්මාර්ක් සහ කොමාන්ඩිමන්ට් මුර අට්ටාල ඉදිරිපසින් ස්ථානගත මෙම ගොඩනැගිල්ලේ ඓතිහාසික අගය හෙලිදරව් කරනු ලබන වැදගත්ම සාධකය වනුයේ මෙහි ඉදිරිපස බිත්තියෙහි ආරුක්කු දොරටුව ඉහළින් වර්ෂ 1686 ලෙස දින සලකුණු සහිත ගල් පුවරුව ය. එම අවදියේ මෙය ගබඩා ගොඩනැගිල්ලක් ලෙසත් ලන්දේසි යුගයේ ඕලන්ද ගැරිසන් නිලධාරීන්ගේ භොජනාගාරය ලෙසත් භාවිත කර ඇත. 1786 දී ගාල්ල කොටුව සංවර්ධන ව්‍යාපෘතිය අනුව මෙම ගොඩනැගිල්ල කාල තුවක්කු හමුදාවේ අවිවාහක සෙබළුන්ගේ ගබඩාව ලෙසින් සිතියම්ගතව ඇත. බ්‍රිතාන්‍ය පාලනයේ දී ප්‍රධාන ආහාර ගබඩාව හෝ දෙපාර්තමේන්තු ගබඩාව ලෙස භාවිත කර ඇති මෙහි ඉදිරිපස කණු සහිත වැරන්ඩා පෙදෙස පසු කාලීන ඉදිකිරීමකි. වර්තමානයේ ගාල්ල ජාතික කෞතුකාගාරය මෙහි ස්ථාපිතය.






**මේවන විට ගාලු කොටුවේ නිවාස 428 පමණ දක්නට ලැබේ. මේවා අතරින් ආසන්න වශයෙන් ගොඩනැගිලි 100ක් පමණ විදේශිකයින් සතුය. මෙම නිවාස බොහෝමයක් යටත් විජිත පාලන සමයේ ඉදිවූ ගොඩනැගිලි වන අතර මෙහි පුරාවිද්‍යාත්මක හා වාස්තු විද්‍යාත්මක අගයන් ආරක්ෂාකොට මතු පරම්පරාව වෙනුවෙන් දායාද කිරීම අප සැමගේ පරම යුතුකමක් බව සිහිකරමි.**



## පැරණි NOH හෝටලය

ගාල්ල කොටුව වරාය නගරයක් ලෙස සංවර්ධනය වීමත් සමග සංචාරක හෝටල් / ආපනශාලා ඉදිවීම බ්‍රිතාන්‍ය පරිපාලනය යටතේ සිදු විය. 19 වන සියවසේ ගාලු කොටුව තුළ විශාල ප්‍රමාණයේ හෝටල් කිහිපයක්ම තිබූ බවට පැරණි සිතියම් ද සාක්ෂි දරයි. එකළ ඉදි වූ විශේෂ හෝටල් ගොඩනැගිල්ලක් ලෙස NOH හෙවත් නිව් ඔරියන්ටල් හෝටලය (New Oriental Hotel) හඳුන්වාදිය හැකිය. පල්ලිය වීදියක් මැද වීදියත් අතර පල්ලිය වීදියට මුහුණ ලා ඇති මෙම තෙමහල් ගොඩනැගිල්ල හමුදා බණ්ඩ අණදෙන නිලධාරියාගේ නිල නිවස පිහිටි පරිශ්‍රයේ ඉදිකර ඇත. 17 වන සියවසේ මුල් අවදියේ දී මෙය ඕලන්ද පූජකවරුන්ගේ නිල නිවස ලෙස භාවිත වී ඇත. වර්තමානයේ දිස්වන හෝටල් ගොඩනැගිල්ල යුරෝපීය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ රැසක් පිළිබිඹු කරන අතර අද වන විට මෙය අමන්ගල්ල හෝටලය නමින් හැඳින්වේ.

# ඉතිහාසයේ පියසටහන්......




ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වර්තමානය දක්වා වූ දේශපාලන, සමාජ, ආර්ථික සහ සංස්කෘතික පරිණාමය විදහා දැක්වෙන **'ගාලු වංශය'** ශාස්ත්‍රීය කෘතිය දකුණු පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය, ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ දකුණු පළාත් සංස්කෘතික අමාත්‍යාංශයේ පූර්ණ අනුග්‍රාහයෙන් ගාලු උරුමය පදනම විසින් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. ඒ සඳහා පහත මාතෘකා යටතේ ලිපි කැඳවීම් මේ දින වල දී සිදු වේ.



- ගාල්ල දිස්ත්‍රික්කයේ භූගෝලීය වටපිටාව හා එහි ස්වාභාවික පසුබිම
- ප්‍රාග් ඓතිහාසික යුගය හා ගාල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසික විකාශනය
- දේශපාලන හා පරිපාලන ව්‍යුහය පැරණි පරිපාලන බෙදීම් (කෝරළ සහ පත්තු)
- සමාජීය පසුබිම (සහජීවනය හා යටිතල පහසුකම්)
- ආර්ථික රටාව හා ජීවනෝපාය
- ආගමික, සංස්කෘතික, සාහිත්‍ය හා කලා උරුමය
- ලෝක උරුම ගාලු කොටුව සහ පුරාවිද්‍යාත්මක ස්මාරක

අනාගතය වෙනුවෙන්

ඉතිහාසයේ ලිඛිත සාක්ෂි සම්පාදනය සඳහා,

ප්‍රබුද්ධ ඔබට ...... විවෘත ආරාධනා !

# “පිංතාලිය” ජල ව්‍යාපෘතිය

සංස්කෘතික හා ඓතිහාසික වටිනාකමකින් යුතු ජීවමාන යුනෙස්කෝ ලෝක උරුම පරිශ්‍රයක් වන ගාලු කොටුව යනු විශාල වශයෙන් දේශීය මෙන්ම විදේශීය සංචාරකයන්ගේ ආකර්ෂණය දිනූ පාරාදීසියකි. නමුත් මෙම දෛනික සපැමිණන්ගේ පානීය ජල අවශ්‍යතාවය සඳහා පහසුකම් අවම මට්ටමක පවතින බව දැකගත හැකිය.





මෙම මූලික අවශ්‍යතාවය ඉටු කරනු වස් ගාලු කොටුවේ උරුම සංකල්පය ආරක්ෂා කරමින් ලාංකේය ජන ජීවිතයේ මුල් බැසගත් ආගන්තුක සත්කාරයේ පානීය ජල භාවිතය ප්‍රතිනිර්මාණය කරමින් ‘දියවර උරුමය’ **පිංතාලි ජල ව්‍යාපෘතිය** ක්‍රියාත්මක කිරීම සඳහා මූලික සැළසුම් සම්පූර්ණ කිරීම ගාලු උරුම පදනම විසින් සිදුකර ඇත.

කොටුව පරිශ්‍රයේ සංචාරකයන් බහුලව රැඳී සිටින හඳුනාගත් ස්ථාන කිහිපයක මෙම පිංතාලි ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති අතර මෙහි පළමු අදියර ලෙස සුධර්මාලය පන්සලට අයත් බෝධියට යාබඳව පළමු පිංතාලිය ඉදිකිරීමට යෝජිතය.

සැලසුම් නිර්මාණය වරලත් වාස්තු විද්‍යාඥ ජයනාත් ද සිල්වා මහතාගේ පූර්ණ අනුග්‍රහය මත සිදුකරන ලද අතර මූලික ඇස්තමේන්තු සකස් කරගැනීමෙන් පසුව ගාලු උරුම සැලසුම් අනුකමිටුවේ අනුමැතිය පරිදි මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

උරුමය ජීවයෙන් පිරවීමට
සිතැති අනුග්‍රාහකභවතුන්
සඳහා
ගෞරවයෙන් යුතුව
ආරාධනා කර සිටිමු!



## ගාල්ල කොටුවේ අතීතය සහ වර්තමානය සම්බන්ධ කරන දැනුමේ දොරටුව: ගාලු උරුම තොරතුරු මධ්‍යස්ථානය

සියවස් ගණනක ඉතිහාසයක්, වාස්තු විද්‍යාත්මක උරුමයක් සහ ජීවමාන සංස්කෘතික පරිසරයක් එකට බැඳුණු ශ්‍රී ලංකාවේ සුවිශේෂී ලෝක උරුමයක් ලෙස ගාල්ල කොටුව හැඳින්විය හැකිය. 1988 වසරේදී UNESCO ලෝක උරුමයක් ලෙස නම් කරන ලද මෙහි උරුම වටිනාකම් හඳුනා ගැනීමටත්, දේශීය හා විදේශීය සංචාරකයන් වෙත නිවැරදි තොරතුරු ලබා දීමටත් ගාලු උරුම තොරතුරු මධ්‍යස්ථානය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

### ඉතිහාසය දකින්නට හැකි තැනක්

ගාල්ල කොටුව හා එහි උරුමය පිළිබඳ චිත්‍ර, තොරතුරු පුවරු සහ ආකෘති ප්‍රදර්ශන කරමින් ගාල්ල කොටුවේ ආරක්ෂක බැමි, බළකොටු, ඓතිහාසික ගොඩනැගිලි සහ එහි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමට සංචාරකයන්ට අවස්ථාව සලසා ඇත.

එමෙන්ම ශ්‍රව්‍ය-දෘශ්‍ය ඉදිරිපත් කිරීම් හරහා ගාල්ල කොටුවේ ඉතිහාසය හා උරුම වටිනාකම් වඩාත් ජීවමාන ආකාරයෙන් අත්විඳීමට අවස්ථාව ලබාදීමෙන් ඉතිහාසය පිළිබඳ පෙර දැනුමක් නොමැති අයෙකුට වුවද, ගාල්ල කොටුවේ වැදගත්කම පහසුවෙන් හඳුනා ගැනීමට මෙම පහසුකම් උපකාරී වේ.

### දැනුම සොයා යන අයට

ගාල්ල කොටුව සහ ඒ ආශ්‍රිත උරුමය පිළිබඳ මාර්ගෝපදේශ පොත් හා පත්‍රිකා මෙම තොරතුරු මධ්‍යස්ථානයෙන් ලබාගත හැකි අතර, ඉල්ලීම මත මාර්ගෝපදේශක සේවාවද සංවිධානය කරගත හැකිය. තවද, ගාල්ල කොටුවේ ඉතිහාසය හා උරුමය සම්බන්ධ දුර්ලභ පොත් සහ ප්‍රකාශන එකතුවක් මෙහි පවත්වාගෙන යනු ලබන අතර, ඒවා සංචාරකයන්ට මෙන්ම සාමාන්‍ය ජනතාවටද යොමුගත කිරීමේ පහසුකමක් ලෙස භාවිත කළ හැකිය.



මෙය සංචාරකයන්ට පමණක් සීමා වූ ස්ථානයක් නොවේ; ගාල්ල කොටුවේ ඉතිහාසය පිළිබඳ අධ්‍යයනය කරන සිසුන්, පර්යේෂකයන්, ඉතිහාසය හා උරුමය පිළිබඳ උනන්දුවක් දක්වන පුද්ගලයන් සහ ප්‍රදේශවාසීන් සඳහාද මෙය අගනා දැනුම් මධ්‍යස්ථානයකි.

# දැන ඉගෙන සංචාරය කරමු.....

## උරුමය අනාගතයට රැගෙන යන මෙහෙවරක්

ගාලු උරුමය පදනමේ පුළුල් මෙහෙවර වන්නේ ගාල්ල කොටුවේ සංරක්ෂණය, සංරක්ෂණාත්මක සංවර්ධනය සහ එහි උරුම වටිනාකම් ප්‍රවර්ධනය කිරීමයි. ඒ සඳහා ප්‍රජාව, පාසල් දරුවන් සහ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ද ගාලු උරුමය පදනම විසින් ක්‍රියාත්මක කරමින් ඇත.

උරුමයක් සංරක්ෂණය කිරීමට පෙර එහි වටිනාකම හඳුනාගැනීම අවශ්‍ය වන බැවින්, මෙම මෙහෙවර තුළ තොරතුරු මධ්‍යස්ථානයට හිමි වන්නේ විශේෂ ස්ථානයකි. එම වටිනාකම පිළිබඳ දැනුම ජනතාව අතර වර්ධනය කිරීම තුළින් අනාගත පරපුරට ගාල්ල කොටුවේ උරුමය ආරක්ෂා කර දීමට ශක්තිමත් පදනමක් ගොඩනැගේ.

**අතීතය දැනගනිමු, උරුමය රැකගනිමු! ගාලු උරුම තොරතුරු මධ්‍යස්ථානය යනු තොරතුරු ලබාදෙන ස්ථානයක් පමණක් නොව, ගාල්ල කොටුවේ අතීතය සහ වර්තමානය අතර සම්බන්ධතාවක් ගොඩනඟන දැනුමේ දොරටුවකි. ගල් බැමි, පැරණි ගොඩනැගිලි සහ මුහුදේ රළ අතර සැඟවී ඇති සියවස් ගණනක කතාව වඩාත් හොඳින් හඳුනාගෙන, එය අනාගත පරපුර වෙත සුරක්ෂිතව රැගෙන යාමට මෙම මධ්‍යස්ථානය ලබාදෙන දායකත්වය අගනේය.**

**ගාල්ල කොටුව නැරඹීමට පැමිණෙන ඔබේ ගමන, එහි ඉතිහාසය නිවැරදිව දැනගැනීමෙන් තවත් අර්ථවත් කරගන්න.**




- **ස්ථානය :**
  බාලදක්ෂ මාවත, ගාල්ල, කොටුව
- **විවෘත වේලාව :**
  පෙ.ව. 9.00 – ප.ව. 4.30
- **විවෘත වන දින :**
  රජයේ නිවාඩු දින හැර සතියේ වැඩ කරන දිනවල විවෘතව පවතී.

# Digitalize වන ශාක නාමකරණය

***ලෝක උරුම ගාලු කොටුවේ ගෘහ නිර්මාණ හා ඓතිහාසික වටිනාකම් අතර සැඟවී පවතින සුවිශේෂී ස්වභාවික උරුමය හඳුනාගනිමින්, එය සංරක්ෂණය හා මහජනතාවට හඳුන්වාදීම අරමුණු කරගත් නව ශාක උද්භිද නාමකරණ ව්‍යාපෘතියක් ගාලු උරුමය පදනම විසින් ආරම්භ කර ඇත.***

## ගාලු කොටුවේ උරුමය ගොඩනැගිලිවලින් ඔබ්බට

ගාලු කොටුව සියවස් ගණනාවක ඉතිහාසය, ගෘහ නිර්මාණ ශිල්පය සහ සංස්කෘතික උරුමය එකිනෙකට බැඳගත් ජීවී ගුණය රැකීමට මෙහි පවත්නා ශාක උරුමය වැදගත් දායකත්වයක් සපයයි.

දේශීය මෙන්ම විදේශීය ශාක විශේෂ රැසකින් සමන්විත මෙම ජීවමාන හරිත පද්ධතිය, පිළිබඳ නිවැරදි හා විශ්වාසදායක තොරතුරු මහජනතාවට පහසුවෙන් ලබාගත හැකි ආකාරයෙන් ඉදිරිපත් කිරීම සඳහා තවදුරටත් වැඩි අවධානයක් ගාලු උරුමය පදනම විසින් දක්වා ඇත.

## 2026 ක්‍රියාකාරී සැලැස්ම යටතේ නව පියවරක්

ගාලු උරුමය පදනමේ 2026 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ ශාක උද්භිද නාමකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ගාලු කොටුවේ පවතින ශාක විශේෂ විද්‍යාත්මකව නිවැරදිව හඳුනාගෙන, ඒ පිළිබඳ තොරතුරු සංචාරකයින්, පාසල් සිසුන්, පර්යේෂකයින්, ස්වභාවික පරිසරය පිළිබඳ උනන්දුවක් දක්වන පිරිස් සහ අධ්‍යාපනික කණ්ඩායම් වෙත පහසුවෙන් ලබාදීමයි.

## විශේෂඥ දැනුම සමඟ ක්ෂේත්‍ර පරීක්ෂාව

මෙම ව්‍යාපෘතියේ වැදගත් ආරම්භක පියවරක් ලෙස 2026 ජූලි 27 දින, මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයේ නිලධාරීන් සහ ගාලු උරුමය පදනමේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂාවක් පවත්වන ලදී.

එහිදී ගාලු කොටුව පරිශ්‍රය තුළ පවතින ශාක විශේෂ හඳුනාගැනීම සහ ඒවා පිළිබඳ අවශ්‍ය තොරතුරු රැස්කිරීම සිදු කරන ලදී. විශේෂඥ දැනුම හා ක්ෂේත්‍ර නිරීක්ෂණ ඒකාබද්ධ කරමින් සිදුකළ මෙම ක්‍රියාවලිය, ඉදිරි නාමකරණ හා තොරතුරු ප්‍රදර්ශන කටයුතු සඳහා ශක්තිමත් පදනමක් සපයනු ඇත.





ගාලු කොටුවේ උරුමය රැකගනිමින්, ප්‍රජාවගේ ගැටලුවලට විසඳුම් සෙවීම කාර්යක්ෂම සිදුකිරීම වෙනුවෙන් ගාලු උරුමය පදනමේ 2026 ක්‍රියාකාරී සැලැස්ම යටතේ ක්‍රියාත්මක "උරුම සායනය" ව්‍යාපෘතිය මේ වන විට ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් ඇත. කොටුව ප්‍රජාව මුහුණ දෙන සංරක්ෂණ, සංවර්ධන සහ අනෙකුත් මූලික ගැටලු සඳහා ප්‍රායෝගික විසඳුම් ලබාදීම මෙහිදී සිදු වේ.

## ආයතනික සම්බන්ධීකරණය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය සහ ගාල්ල මහ නගර සභාව ඇතුළු අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කරමින් මහජන ගැටලු සඳහා විසඳුම් ලබාදීමට මැදිහත් වෙමින් ඉඩම් හිමිකම නිරවුල්ව පවතින, අඩු ආදායම්ලාභී හෝ සැලසුම් සකස් කර ගැනීමේ හැකියාව නොමැති නිවාස හිමිකරුවන් සඳහා අවශ්‍ය සංරක්ෂණ සැලසුම් නොමිලේ සකස් කර දීමටත්, අදාළ අනුමැතීන් ලබාගැනීමට අවශ්‍ය සහය ලබාදීමටත් ගාලු උරුමය පදනම සක්‍රියව දායක වෙමින් ඇත.










Short Video & Photography Competition and Exhibition – 2026
Showcase the heritage of Galle Fort to the world through your camera lens from a new perspective! 💙
You now have the opportunity to creatively capture the cultural, historical, and natural heritage of Galle Fort through photography and video, using digital technology.



ගල් බැම් අතරින් අදටත් කතා කරන සියවස් ගණනක ඉතිහාසය සහිත සුන්දර ගාලු කොටුව ශ්‍රී ලංකාවේ දකුණු වෙරළ තීරයේ පිහිටි අතීතයට පමණක් අයිති නොවූ අදටත් සාමාන්‍ය ජන ජීවිත හුස්ම පිඹිමින් මුහුදට මායිම් වූ ලෝක ප්‍රසිද්ධ සුන්දර භූමියකි.

1588 දී පෘතුගීසීන් විසින් ඉදිකිරීම ආරම්භ වී ලන්දේසීන් විසින් විශාල සංවර්ධන ව්‍යායාමයකින් පසු බ්‍රිතාන්‍ය සමයේ සංරක්ෂණය වූ මෙම බලකොටුව ගාලු ඉතිහාසයේ පෞඪත්වයේ සංකේතයයි.

ගාලු කොටුවේ දැනට ශේෂ වී ඇති පෘතුගීසි නිර්මාණ අතර පැරණිතම සහ ප්‍රධානතම ආරක්ෂක මුර පොළ කළු කොටුවයි. ඔවුන් විසින් 16 වන සියවසේ ඉදිකරන ලද පෝටලිසා හෙවත් සාන්ත කෲස් නමින් හැඳින් වූ මෙය 1640 වසරෙන් පසුව ලන්දේසින් විසින් සංවර්ධනය කර ස්වාර්ට් යුධ අට්ටාලය වශයෙන් නම් කරන ලදී.

ඉංග්‍රීසි සමයේ දී ගාල්ල කලාපයේ ප්‍රධාන අණදෙන නිලධාරියාගේ ප්‍රධානතම ආරක්ෂක නිලධාරියා මෙහි ආරක්ෂක කටයුතු භාරව කටයුතුකර ඇත. මාලක දෙකකින් යුත් මෙම යුධ අට්ටාලයේ ඉහළ මාලකයේ කම්මල් හා භූගත වෙඩි බෙහෙත් ගබඩාවක් ද ස්ථාපනය කර ඇත.

මෙයට කළු කොටුව යන නම පබැඳීමට මතවාද කිහිපයක් ජනප්‍රවාදවල පැවැත එන අතර ප්‍රධාන ලෙස හේතු වී ඇත්තේ ආයුධ නිශ්පාදනය කරනු ලැබූ කම්මල් වලින් ඇති වූ කළු දුමාරය නිසා මෙහි ගොඩනැගිලි බිත්ති දැලි වලින් වැසී පැවතීම ය. එසේම ලන්දේසීන් විසින් මෙහි සේවයට රැගෙන පැමිණි වහල් අප්‍රිකානු ජාතිකයින් රැඳවූ බැවින් ද එම නාමය පටබැඳී ඇත. පහළ මාලකය වෝටර් පාස් ජල සැපයුම වශයෙන් හැඳින් වූ අතර එම මාලකයෙහි ඉහළ මාලකයේ සිට පිවිසීමට ක්‍රමික ආනතියකින් යුත් උමං මාර්ගයක් ඉදිකර ඇත.

## කම්මල්/සිරමැදිරි (Black smith's workshop/prison cells)

අතීත සිරකරුවක්ගේ නිහඬ කතාවන් තවමත් සඟවාගෙන සිටින සලකුණක් ලෙස 16වන සියවසේ පෘතුගීසීන් විසින් ඉදිකළ ශාන්ත කෲස් බලකොටුව ලන්දේසීන් විසින් යුධ අට්ටාලයක් බවට පත්කර ඇත. එහි දී අප්‍රිකානුවන් යොදවමින් ආයුධ නිශ්පාදනය කළ කම්හල් අද ද දක්නට ඇත. මෑතකදී කළ කැණීම්වල දී මෙහි භූගතව ගල් අඟුරු ස්ථර හඳුනාගෙන ඇත.

බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙම යුධ අට්ටාලයේ පොලීසිය ස්ථාපනය වීමත් සමග මෙම කුටි සිරමැදිරි ලෙස භාවිත කර ඇත. කුටි 06කින් යුතු මෙම ගොඩනැගිල්ලේ කුටි 04ක බොකු වහල වර්තමානයේදී ආරක්ෂා වී ඇති අතර කුටි වලට වාතාශ්‍රය ලැබෙනු පිණිස බොකු වහලයේ ඉහළ කොටසෙහි වා කවුළුව බැගින් ඉදිකර ඇත.





# වෙඩි බෙහෙත් ගබඩාව (Gun Powder Magazine)

ඉහළ මාලකයේ භූගත ගොඩනැගිල්ලක් ලෙස 17 වන සියවසේ මුල් වකවානුවේ පෘතුගීසීන් විසින් ඉදිකළ වෙඩි බෙහෙත් ගබඩාවක් මෙහි දක්නට ඇත. ගාල්ල ලන්දේසි අණදෙන නිලධාරියාගේ ප්‍රධාන ආරක්ෂකයා විසින් ද භාවිත කර ඇති මෙය නේවාසිකව මෙම ස්ථානයේ රැඳී සිටි ලන්දේසි කාලතුවක්කු සේනාංක ඔවුන්ට අවශ්‍ය වෙඩි බෙහෙත් හා යුද්ධායුධ තැන්පත් කර තිබුණි. මෙහි දොර වැසූ පසු වාතාශ්‍රය ලැබීමට වා කවුළු කිහිපයක් ඉදිකර ඇත. මෙහි උතුරු දෙසට වූ මැද මිදුල හරහා ආලෝකය හා වාතාශ්‍රය ලැබීමට කවුළු ඉදිකර ඇත.

1844 දී බ්‍රිතාන්‍යයන් කළු කොටුවේ පොලිස් ස්ථානය ස්ථාපනය කිරීමත් සමග පොලීසියට අවශ්‍ය වෙඩි බෙහෙත් සහ ආයුධ තැන්පත් කිරීමට මෙම ගොඩනැගිලි යොදා ගන්නා ලද අතර 20 වන සියවසේ මුල් භාගයේ මෙහි ස්ථාපිත වූ පොලීසිය ගාලු කොටුවෙන් ඉවතට රැගෙන යාමත් සමග වෙඩි බෙහෙත් ගබඩා භාවිතයෙන් ඈත් වී ඇත.



# පහළ මාලකය ( Water Pass)

ස්වාර්ට් යුධ අට්ටාලය හෙවත් කළු කොටුවෙහි පහළ මාලකය (water Pass) ජල සැපයුම ලෙස නම්කර ඇත. මෙය ගාල්ල වරායට සෘජුවම ආරක්ෂාව සැපයූ ආරක්ෂක මධ්‍යස්ථානයයි. ඉහළ මාලකයේ සිට පහළ මාලකයට පිවිසීමට ඉදිකරන ලද උමං මාර්ගයේ රැකවල් කටයුතු සඳහා රහස් කුටියක් සහ ඉහළ මහලේ සිට ක්‍රියාත්මක කර පහලට හෙලිය හැකි දොරටුවක් මගින් ඉහළ මාලකයට පිවිසීම සිමා කිරීමක් ද සිදුකර ඇත. යුධ අට්ටාලය භාරව සිටි ප්‍රධාන හමුදා නිලධාරියාගේ නේවාසික කුටිය උමං මාර්ගය ආරම්භයේ පිහිටි නිසා පහළ මාලකයේ ආරක්ෂක කටයුතු සෘජුව නිරීක්ෂණයට හැකිවිය.

පහළ මාලකයේ කාලතුවක්කු රැඳවුම් ස්ථාන 08ක් දක්නට ලැබේ. ගාලු වරායට සහ ජැටියට මෙන්ම ප්‍රධාන ගබඩා ගොඩනැගිල්ලට අවශ්‍ය ආරක්ෂාව ලබාදීම මෙහි භාර සෙබලුන්ගේ ප්‍රධාන රාජකාරිය විය. 1844 දී බ්‍රිතාන්‍ය පාලනයත් සමග මෙහි භාවිතාවේ වෙනස්කම් සිදු වී ඇත.

අතීතයේ අභිමානයත්, ඉතිහාසයේ නොමැකෙන මතකයත් අදටත් රැකගෙන සිටින ගාල්ල කළු කොටුව, ගාල්ලේ පමණක් නොව ශ්‍රී ලංකා උරුමයේ අගනා සලකුණකි. එහි ගල් බිත්ති අතරින් ගලායන සුළඟත්, මුහුදේ රළ බිඳෙන හඬත් අපට කියා දෙන්නේ අතීතයේ මතක කතාවකි. එබැවින් කළු කොටුව යනු හුදෙක් නැරඹීමට ඇති ස්ථානයක් පමණක් නොව අපේ ඉතිහාසයේ අප නොදුටු කතාව අත්විඳිය හැකි අනුස්මරණය කළ හැකි ජීවමාන සුසුම් සහිත උරුම භූමියකි.



# උරුම ආරක්ෂණයේ හෙට දවස.....

ඓතිහාසික ගාලු කොටුවේ උරුමය සංරක්ෂණය හා කළමනාකරණය වෙනුවෙන් කැපවී සිටින ගාලු උරුමය පදනමේ නව පරිපාලන හා කාර්ය මණ්ඩල ශක්තිය තවදුරටත් වර්ධනය කරමින්, පුරප්පාඩුව පැවැති තනතුරු සඳහා නව නිලධාරීන් වෙත පත්වීම් ලිපි නිල වශයෙන් ප්‍රදානය කිරීමේ සුවිශේෂී අවස්ථාව 2026 සැප්තැම්බර් 16 වන දින ගාලු උරුමය පදනමේ තොරතුරු මධ්‍යස්ථානයේදී පැවැත්විණි.

මෙහිදී, ගාලු උරුමය පදනමේ ඉදිරි මෙහෙයුම් වඩාත් විධිමත් කිරීම සඳහා,

- අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී
- ගිණුම් නිලධාරී
- ආරක්ෂක නියාමක යන තනතුරු සඳහා නව පත්වීම් ලිපි ප්‍රදානය කරන ලදී.

මෙම සුවිශේෂී අවස්ථාවට ගරු දකුණු පළාත් ආණ්ඩුකාර ආචාර්ය සුසිරිපාල මානවඩු මැතිතුමා, ගරු ධීවර, ජලජ හා සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍ය රත්න ගමගේ මැතිතුමා, ගාලු උරුමය පදනමේ සභාපති මහාචාර්ය දේව මයිකල් ද සිල්වා මහතා, හිටපු අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී අසංග උදුල ධර්මදාස මහතා ඇතුළු නව පත්වීම්ලාභීන් සහ ගාලු උරුමය පදනමේ නිලධාරී මහත්ම මහත්මීන් සහභාගි වූහ.

උත්සවයේ ආරම්භය සනිටුහන් කරමින්, ගාලු උරුමය පදනමේ සභාපති මහාචාර්ය දේව මයිකල් ද සිල්වා මහතා විසින් පැමිණ සිටි සියලුම සම්භාවනීය අමුත්තන් උණුසුම් අයුරින් පිළිගනිමින් පිළිගැනීමේ කථාව සිදු කරන ලදී. අනතුරුව, ගරු දකුණු පළාත් ආණ්ඩුකාර ආචාර්ය සුසිරිපාල මානවඩු මැතිතුමා සහ ගරු ධීවර, ජලජ හා සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍ය රත්න ගමගේ මැතිතුමා විසින් අදහස් දැක්වීමෙන් පසු, පත්වීම්ලාභීන් වෙත පත්වීම් ලිපි ප්‍රදානය කිරීම සිදු කරන ලදී.

**"අභිමානවත් ඉතිහාසයකට හිමිකම් කියන ගාලු කොටුව මතුපරපුර උදෙසා රැකගැනීමේ මේ උතුම් සහ අභියෝගාත්මක මෙහෙවරට අත්වැලක් වීමට එක්වූ නව පත්වීම්ලාභී සියලුම නිලධාරීන් වෙත ගාලු උරුමය පදනමේ අපගේ උණුසුම් හා හෘදයාංගම සුබ පැතුම්!"**









GALLE
HERITAGE
FOUNDATION

# ගාලු උරුමය

III කලාපය ජූලි -සැප්තැම්බර්

# GALLE HERITAGE

## ලෝක උරුමයක අභිමානය සුරකින නිල පුවත් සංග්‍රහය



ඉදිරි ව්‍යාපෘති අතර..................

1. සංචාරක ආරක්ෂාව වෙනුවෙන් මුර සංචාර.........
2. වීදි නාමපුවරු.................
3. යටිතල පහසුකම් සංවර්ධනය...................
4. උරුමය රැකීමට ප්‍රජා සහභාගිත්වය..................